## 2022 මාර්තු මස 16 දින පැවති සෞඛ්‍ය, පරිසර, කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටුව

**කමිටු සාමාජිකයන් පැමිණීම**

1. සුසිල් තිලකරත්න මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. එම්.පි.එම්.අන්සාර් මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. ඩබ්.එම්.සුපිනි සඳමාලි මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. සුරංගී ආර් සමරතුංග මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. ආර්.ඒ.විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. එච්.බී.සිතා හේරත් මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නිලධාරි**

1. වෛද්‍ය ආර්.එම්.ඩබ්.ඩී.රත්නායක මහතා - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
2. වෛද්‍ය ප්‍රදීප් නන්දදාස මහතා - නාගරික පශු වෛද්‍ය නිලධාරි
3. ජයනී රාජකරුනා මිය - නාගරික ගණකාධිකාරි
4. කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
5. එන්.පී.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
6. ජී.වී.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක
7. එම්.ජී.සී.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
8. පද්මා සෙනෙවිරත්න මිය - සැළසුම් අංශ ප්‍රධානි
9. ආර්.එම්.ආර්.ඩී.රාජපක්ෂ මෙනවිය - සංවර්ධන නිලධාරි
10. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

**නිලධාරි නොපැමිණීම**

1. වෛද්‍ය ආර්.එම්.ඩබ්.ඩී.රත්නායක මහතා - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
2. වෛද්‍ය ප්‍රදීප් නන්දදාස මහතා - නාගරික පශු වෛද්‍ය නිලධාරි
3. ජයනී රාජකරුනා මිය - නාගරික ගණකාධිකාරි
4. කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
5. එම්.සී.ජී.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක

1. අනුරාධපුර,විජේපුර,අශෝක මාවත,අංක:244,කේ.එන්.රංජිත් සමරපාල යන අය ලිපියක් ඉදිරිපත් කරමින් මෙම අය අනුරාධපුර මහා නගර සභාවේ අනියම් පදනම මත සෞඛ්‍ය කම්කරුවකු ලෙස සේවය කරමින් සිට නොදන්වා සේවයට වාර්තා නොකිරිම මත සේවය අහිමි වි ඇත. ඔහු විසින් නැවත එම තනතුරේ සේවය පිහිටුවා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
   දෛනික පැමිණිමේ ලේඛනය මගින් බඳවා ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික කොමසාරිස්)

2. අනුරාධපුර,මුලස්ථාන පොලිසිය,මුලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂකතුමා විසින් 2022.01.28 වන දින ප්‍රජා පොලිස් ස්ථානිය උපදේශන සභාවේ සාකච්ඡා කරන ලද කරුණු පිළිබඳ ඉදිරිපත් කර ඇති ලිපිය.
   ප්‍රජා පොලිස් ස්ථානිය උපදේශන සභාවේ රැස්වීම්වලට මහා නගර සභාව විසින් අවශ්‍ය සහය ලබා දෙන බවත්, ඊළඟ රැස්විම් වාරය මහා නගර සභාව වෙත දැනුම් දෙන ලෙසත්, තවද ඉදිරියට පවත්වන රැස්වීම් සඳහා මහජන නියෝජිතයන් සහභාගි කරවිමට සුදුසු බව යෝජනා කර ස්ථානාධිපතිතුමා වෙත ලිපියක් යොමු කිරිමට තීරණය විය. (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

3. අනුරාධපුර,උදය මාවත,3 වන පටුමග,අංක:150/29ඒ,එස්.ඒ.අජිත් සුහසිංහ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මිරිදිය මාළු ව්‍යාපාරය කරගෙන යාම සඳහා උදය මාවතේ ස්ථානයක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලිම.
   ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව ක්‍රියාත්මක කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

4. ගරු නාගරික මන්ත්‍රී එල්.ජී.ප්‍රේමචන්ද්‍ර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් ආර්.එම්.පැතුම් සංජීව යන අයටහට මිරිදිය මාළු ලැල්ලක් පවත්වාගෙන යාමට ස්ථානයක් ලබා දුන් අතර එම ස්ථානය මුදල ගෙවා වෙළඳාම් කටයුතු කිරිමට අවසර ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
   ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව ක්‍රියාත්මක කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

5. කොළඹ 05, පාර්ක් මාවත, අංක:40/18, Alcohol and Drug Information Centre, වැඩසටහන් කළමනාකරු අමරනාත් තැන්න මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මද්‍යසාර, දුම්කොළ සහ වෙනත් මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මග පෙන්විම සහ අවශ්‍ය තොරතුරු සැපයිමට මෙම ආයතනයට හැකියාව ඇති බව දන්වා එවන ලද ලිපිය.
   වැඩ සටහන් කළමනාකාරු සමග සාකච්ඡා කර තීරණයක් ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි)

6. අනුරාධපුර, යසසිරිපුර, 5 වෙනි පටුමග, අංක:232, ඩබ්.ජී.සුනන්දා විරසිංහ මිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් යසසිරිපුර අංක:224 දරණ නිවසේ අයිතිකරු විසින් 06 වෙනි පටුමග හා එයට සමාන්තරව තිබූ රජයේ රක්ෂිතයද බලෙන් අල්ලා ගෙන තම ඉඩමට යා කර තාප්පයක් ඉදිකර ඇති බැවින් එම මාර්ගය

අවහිරවී ඇත. 04 වෙනි පටුමග සිට අනුරාධපුර - පුත්තලම මාර්ගයට යා හැකිව තිබූ රජයේ රක්ෂිතය ද කීප දෙනෙකු විසින් බලෙන් අල්ලා ගෙන තම ඉඩම්වලට යා කරගෙන වැට ගසා ඇත. මේ පිළිබඳ අවධානය යොමු කර සියලු බාධක ඉවත් කර පෙර පරිදි ගමනා ගමනය සඳහා 06 වෙනි පටුමග හා රජයේ රක්ෂිතය විවෘත කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.
මෙම ඉල්ලීම සම්බන්ධව අධික්ෂණය කර කඩිනමින් ක්‍රියාත්මක කිරිමට තීරණය විය. (වගකීම - නාගරික ඉංජිනේරු)

7. ගරු නාගරික මන්ත්‍රී නදිර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 296 ඉසුරුමුණිය, 297 වෙස්සගිරිය, 295 තිසාවැව, 295/ඒ දේවානම්පියතිස්සපුර යන ග්‍රාම නිලධාරි වසම්වල ශ්‍රමදාන කටයුතු 2021 වර්ෂයේදී සිදු නොවුන නිසා 2022 අප්‍රේල් මස 06,07 හා 08 යන දිනයන් වෙන් කර අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.
2020 වර්ෂයේ මෙම ශ්‍රමදාන සිදු කල බැවින් ඉතිරි වී ඇති කොට්ඨාශ 03 න් පසු ඉටු කිරිමට තීරණය විය. (වගකීම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි /නාගරික ඉංජිනේරු)

8. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් ලිපියක් ඉදිරිපත් කරමින් නිසල නිම්න භූමියේ පිහිටුවා ඇති ප්‍රතිකර්ම පද්ධතිය වැඩිදියුණු කිරිම් කඩිනමින් කළයුතු බවට වාර්තා කිරිම.
මෙය කඩිනමින් ක්‍රියාත්මක කිරිමටත්, මුදල්මය සහනදායි ක්‍රමයක් සඳහා වෙනත් ආයතන දැනුවත් කර තීරණයක් ගැනිමට තීරණය විය. (වගකීම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි)

9. කමිටු සභාපති ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් මහා නගර සභාවේ සියළුම දෙපාර්තමේන්තු / අංශ තුල අඩුපාඩු තිබේ නම් එම අඩුපාඩු ලිඛිතව මෙම කමිටුව වෙත ලබා දෙන ලෙස දෙපාර්තමේන්තු වෙත දැනුවත් කිරිමට තීරණය විය. (වගකීම - පරිපාලන නිලධාරි)

10. කමිටු සභාපති ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් නගර සීමාවේ සියලුම පොදු වැසිකිළි අළුත්වැඩියා කිරිමට කල යෝජනාව.
පොසොන් උත්සවයට පෙර සියළුම පොදු වැසිකිළි සුද්ධ පවිත්‍ර කිරිමට තීරණය විය. (වගකීම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි)

11. කොට්ඨාශ තුල ලබාදීමට යෝජිත කසල බඳුන් බෙදාදීමේ වැඩසටහනේදී ගරු නාගරික මන්ත්‍රී නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා සහ ජේ.එම්.සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා යන නාගරික මන්ත්‍රීවරු දෙදෙනාහට ප්‍රතිපාදන වෙන් කර දෙන මෙන් කර ඇති ඉල්ලීම.
කසළ බඳුන් කොට්ඨාශයට වෙන් කර ලබාදීමේදි මෙම මන්ත්‍රීවරු දෙදෙනාට ද ලබාදීමට තීරණය විය. (වගකීම - නාගරික ගණකාධිකාරි /සැළසුම් අංශ ප්‍රධානි)

**<u>වෙනත්</u>**

- 2022 වර්ෂ ශ්‍රමදාන කටයුතු කොට්ඨාශ 14 තුල සිදුකිරිම සඳහා කොට්ඨාශ අනුපිළිවෙල සකස් කිරිමට තුණ්ඩු දමා කොට්ඨාශ අනුපිළිවෙල තෝරා ගැනිම.

සුසිල් තිලකරත්න,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,

සෞඛ්‍යය, පරිසර, කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.